**කැලණිය විශ්වවිද්‍යාලය - 2013**

කැලණිය විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1. 4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1. තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය සතු මුදල් ආයෝජනය කිරීමෙන් (Repurchase agreement) ලැබුණු රු.11,389,747 ක් වූ පොලී ආදායම් විශ්වවිද්‍යාල ආදායමට බැර කිරීම වෙනුවට රු.11,234,063 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල වැඩි දියුණු කිරීමේ අරමුදලටද රු.155,684 ක් උපකුලපති අරමුදලටද බැර කර තිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් අක්කර 03 ක් වන ඉඩම් කට්ටි 03 ක වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) ශාස්තු අයකර පවත්වනු ලබන පාඨමාලා ආදායම් හා බැංකු ගිණුම් 02 කට සිදු කරන ලද ඍජු බැර කිරීම් එකතුව වූ රු.883,070 ක් හඳුනා ගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම මුදල් "වෙනත් ගෙවිය යුතු ගිණුමට" බැර කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති, ආපසු නොගෙවන පුස්තකාල තැන්පතු රු.13,481,417 ක් විශ්වවිද්‍යාලයේ ආදායමට ගැනීම වෙනුවට පීඨ කාර්යාලවල හා ප්‍රධාන පුස්තකාලයේ තැන්පතු ලෙස සංචිත යටතේ දක්වා තිබුණි.

**2.2.2 නොසැසඳූ පාලන ගිණුම්**

2013 දෙසැම්බර් 31 දිනට සේවක ණය හා අත්තිකාරම් ලෙජර ශේෂය හා එයට අදාල උපලේඛනය අතර වූ රු.557,481 ක වෙනස නිශ්චිතව හඳුනා නොගෙන ණය හා අත්තිකාරම් ගිණුමට ගැලපීම් කර වෙනත් ගෙවිය යුතු ගිණුම නම් වූ තාවකාලික අවිනිශ්චිත ගිණුමකට ඇතුළත් කර තිබුණි.

## 2.3 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | 2011 සහ 2012 වර්ෂ තුළදී ගෙවා ඇති දැනට නිමවූ පර්යේෂණ වලට අදාල අත්තිකාරම් රු.449,250 ක්, විවිධ අත්තිකාරම් රු.250,000 ක් සහ ආබාධිත අත්තිකාරම් රු.363,782 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1)වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ, අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගෙවූ රු.1,047,063,053 ක වැටුප් හා දීමනාවල නිවැරදිතාවය පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීමේ ලේඛන සහ නිවාඩු ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කළ දීමනා පමණක් පාලක මණ්ඩල අනුමැතිය ඇතිව ගෙවීම් කළ හැකි වුවත්, එයට අනුකූල නොවන පරිදි පාලක මණ්ඩල අනුමැතිය මත පමණක් දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ සම්මන්ත්‍රණ පැවැත්වීම වෙනුවෙන් කථිකාචාර්යවරුන් ඇතුළු සම්මන්ත්‍රණ කාර්ය මණ්ඩලය වෙත රු.6,188,774 ක දීමනා ගෙවා තිබුණි.<br><br>(ii) පාලක මණ්ඩල අනුමැතිය මත භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ උපකරණ අළුත්වැඩියා කිරීම වෙනුවෙන් නිලධාරියෙකුට මාසිකව රු.10,000 බැගින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට 2014 ජුලි දක්වා රු.190,000 ක් ගෙවා තිබුණි.<br><br>(iii) සමාලෝචිත වර්ෂයේදී පවත්වනු ලැබූ සිංගප්පූරු කලාවේදී උපාධි වැඩසටහන - 2011/2012 සඳහා පාලක සභා අනුමැතිය මත දීමනා ගෙවීම් රේටයන් තීරණය කර විශ්වවිද්‍යාලයේ නිලධාරින් සඳහා වර්ෂය තුළ රු.165,000 ක දීමනා ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව පීඨාධිපතිවරුන් දෙදෙනෙකු හා පුස්තකාලාධිපතිට සමාලෝචිත වර්ෂය සඳහා රු.484,421 ක ඉන්ධන දීමනා ගෙවා තිබුණි. |
| (ඉ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ | |
| | (i) 2012 අප්‍රේල් 23 දිනැති අංක 981 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ කොන්දේසි වලට අනුකූල නොවන පරිදි යතුරු ලේඛිකාවක් මඟින් විභාග ප්‍රශ්න පත්‍ර යතුරුලියනය කිරීම වෙනුවෙන් රු.5,500 ක් ගෙවා තිබුණි. |
| | (ii) 2005 අප්‍රේල් 26 දිනැති අංක 861 දරන චක්‍රලේඛය | කලාවේදී (සාමාන්‍ය) උපාධි (විදේශ) පාඨමාලාව සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීම (Paper settings), නැවත සැකසීම (Moderating), පිළිතුරු පත්‍ර ඇගැයීම (Paper Marking) වැනි කාර්යයන්හි නියැලීම වෙනුවෙන් චක්‍රලේඛයට පටහැනිව ගාස්තු ගෙවා තිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.226,857,577 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.148,776,150 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.78,081,427 කින් වැඩිවීමට බාහිර විභාග ආදායම් රු.70,799,932 කින් හා විදේශ උපාධි අපේක්ෂකයින්ගේ ලියාපදිංචි ගාස්තු රු.22,103,142 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **අධ්‍යයන කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ 2010 සහ 2011 අධ්‍යයන වර්ෂයන් සසඳන විට 2011 වර්ෂයේදී මුළු ශිෂ්‍ය ලියාපදිංචියේ සියයට 75 ක වර්ධනයක් නිරීක්ෂණය විය. එහෙත් 2012 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය 2014 සැප්තැම්බර් 30 දක්වා නිමකර නොතිබුණි.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව 2012 හා 2013 වර්ෂයන්හි විභාග පැවැත්වූ උපාධි පරීක්ෂණ 11 ක විභාග ප්‍රතිඵල නිකුත්කිරීම පිළිබඳ දින නිශ්චය කර නොතිබූ අතර එයින් 2013 දෙසැම්බර් 31 දිනට විභාග ප්‍රතිඵල නිකුත් කර තිබුණේ උපාධි පරීක්ෂණ 03 ක පමණි. ඒ අනුව විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී අධික කාල ප්‍රමාදයක් පවතින අතර විභාග ප්‍රතිඵල නිකුත් නොකළ උපාධි පරීක්ෂණ 08 ක් සඳහා විභාගයට පෙනී සිටි 41,108 ක පමණ සිසුන් සංඛ්‍යාවක් විභාග ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින බැවින් සියයට 62 ක පමණ සිසුන් පිරිසකට මෙම ප්‍රමාදය අහිතකර ලෙස බලපා තිබුණි.

(ඇ) පර්යේෂණ ප්‍රගතිය

---------------------

(i) අභ්‍යන්තර පර්යේෂණ ආධාර උපයෝජනය හා ප්‍රගතිය

------------------------------------------------------------

අභ්‍යන්තර පර්යේෂණ ආධාර සඳහා ඒකාබද්ධ අරමුදලින් 2013 වර්ෂයේ දී එක් පීඨයකට රු.මිලියනය බැගින් රු.මිලියන 06 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර 2013 වර්ෂය සඳහා පර්යේෂණ කමිටුව විසින් පර්යේෂණ ව්‍යාපෘති 12 ක් සඳහා රු.3,051,000 ක මුදලක් අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ දී එහි උපයෝජනය රු.1,304,269 ක් එනම් සියයට 43 ක් විය. එසේම වාණිජ හා කළමනාකරණ පීඨය හා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සඳහා ප්‍රතිපාදිත මුදල් කිසිවක් උපයෝජනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා අනුමත පර්යේෂණ ව්‍යාපෘති 12 න් පර්යේෂණ ප්‍රගති වාර්තා ඉදිරිපත් කර තිබුණේ ආචාර්යවරුන් 04 දෙනෙකු පමණි.

(ii) බාහිර පර්යේෂණ ආධාර හා එහි උපයෝජනය

--------------------------------------------------

විවිධ ක්ෂේත්‍රවල ආචාර්යවරුන්ට ලබා දුන් රු.14,115,614 ක ශිෂ්‍යත්ව අරමුදල් උපයෝජනය නොකර දිගින් දිගටම අදාළ අරමුදල් ගිණුම් වල ඉදිරියට ගෙන යන බව නිරීක්ෂණය විය.

(iii) පර්යේෂණ දීමනා ගෙවීම

----------------------------

විශ්වවිද්‍යාලයේ අංශ 07 ක නිලධාරින් 548 කට අදාලව 2013 වර්ෂයෙහි පර්යේෂණ දීමනා සඳහා ප්‍රතිපාදිත මුදල රු. මිලියන 98.5 ක් වූ අතර එයින් පර්යේෂණ දීමනා වශයෙන් රු. මිලියන 97.76 ක මුදලක් ගෙවා තිබුණි. පර්යේෂණයන්හි 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය පිළිබඳ නිසි ඇගැයීමක් සිදුකර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීමට අදාල නිර්ණායකයන් වලට අනුව පර්යේෂණ නිර්ණායකයන් වැදගත් වන බැවින් ලෝක ශ්‍රේණිගත කිරීම අනුව කැලණිය විශ්වවිද්‍යාලය 2013 වර්ෂයේදී 3430 වන තත්ත්වයේ පැවතියද, 2014 ජුලි වන විට 3194 දක්වා වර්ධනය වී තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රධාන පුස්තකාලය සඳහා සවිකර ඇති ආරක්ෂක කැමරා පද්ධතිය (CCTV) 2010 සැප්තැම්බර් සිට ක්‍රියාවිරහිත වී තිබුණි. එම පද්ධතිය අළුත්වැඩියා කිරීමට හෝ නැවත අළුතින් සවිකිරීමට 2014 අගෝස්තු දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) බාහිර පර්යේෂණ සඳහා විශ්වවිද්‍යාල අරමුදලින් වැය කරන ලද රු.620,635 ක මුදල් අදාල ආයතන මඟින් ප්‍රතිපූරණය කරවාගත යුතු වුවත් මෙතෙක් එම මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශිෂ්‍යත්ව අරමුදල් වලින් ලැබෙන පොළී ආදායම් ගිණුම් වල රු.5,699,883 ක ශේෂයක් පැවති අතර ඒ තුළින් ගිණුම් 23 ක රු.4,779,429 ක් වූ අරමුදල් ශේෂයන් 2009 වර්ෂයේ සිට අදාළ අරමුණු ලඟා කර ගැනීමට උපයෝජනය කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට විශේෂ කාර්යයන් උදෙසා ලබා දී තිබූ රු.6,275,204 ක අරමුදල් අදාල කාර්යයන් හි යොදවා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ දී අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල වැඩි දියුණු කිරීමේ අරමුදලක් (University Enhancement Fund) පිහිටුවා රු.69,617,381 ක් එම අරමුදලට බැර කර තිබුණි. මෙම අරමුදල සඳහා පොදු සංචිතයෙන් රු.58,383,318 ක් බැර කර තිබුණද, එසේ අරමුදලක් ඇතිකර ගැනීමට අදාල අනුමැතිය ලබා ගෙන නොතිබූ අතර අරමුදල පිහිටුවීමේ අරමුණු හෝ එම අරමුදල පාලනය සඳහා නීති රෙගුලාසි ද සකස් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධ්‍යයන නොවන කාර්යය මණ්ඩලය හා ශිෂ්‍යයින් වෙත නිකුත් කරන ලද ආපසු භාරනොදුන් රු.335,523 ක් වටිනා පොත් 560 ක් විය.

(ඉ) බාහිර පර්යේෂණ කිරීම සඳහා විවිධ ආයතන විසින් 2000 වර්ෂයට පෙර ලබා දී තිබූ ප්‍රදානයන්ගෙන් ඉතිරිව තිබූ රු.99,775 ක මුදල් එම ආයතන වලට නැවත නොයවා මුදල් කමිටු නිර්දේශය මත විවිධ ආදායමට බැර කර තිබුණි.

**4.4 කාර්යය මණ්ඩල පරිපාලනය**

---

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව සැසඳීමේදී පුරප්පාඩු සංඛ්‍යාව 231 ක් විය.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---

**5.1 ක්‍රියාකාරි සැලැස්ම**

---

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ඉලක්ක ඉටු කර ගැනීමේ ප්‍රගතිය 2013 ජුනි 30 දිනට සියයට 57 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට කාර්යයන් ඇගැයීම් කර ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාල උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) පුස්තකාල පාලනය
(ඈ) වාහන පාලනය
(ඉ) කොන්ත්‍රාත් පාලනය